**ශීර්ෂය 6 - රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

-----------------------------------------------------------------------------------------------

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විගණනය වෙත ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

-----------------------------------------------------------------------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---------------------

ශීර්ෂය 6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජූලි 18 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 විගණන නිරීක්ෂණය**

----------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම

වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.10 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි | මුදල් රෙගුලාසි 127 ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
| --- | --- | --- | --- |
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. | 1. ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබීම. | 2.3 |
| | | 2. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරීම. | 2.9 |
| | | 3. අග්‍රිම ඇස්තමේන්තු පිළියෙල කිරීමේ අඩුපාඩු | 2.7 |
| | | 4. ලේඛන හා පොත් පවත්වා නොතිබීම. | 2.8 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. අනුකූල නොවීම් | 2.9 |
| | | 2. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු | 2.10 |
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් | 2.4 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

### 2.1 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යභාරයන්

-----------------------------------------------------

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය මගින් පැවරී ඇති බලතල අනුව යුධ හමුදා, නාවික හමුදා හා ගුවන් හමුදා සාමාජිකයකු හෝ මැතිවරණ කොමිෂන් සභාව විසින් පත් කරන ලද මැතිවරණ කොමිෂන් සභාවේ නිලධරයෙකු හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පත් කරන ලද පොලිස් නිලධරයෙකු හෝ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරන ලද උප ලේඛන ගත රජයේ නිලධරයෙකු හෝ විගණන සේවා කොමිෂන් සභාව විසින් පත් කරන ලද ශ්‍රී ලංකා විගණන සේවයේ සාමාජිකයෙකු හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරන ලද පළාත් රාජ්‍ය සේවකයින් හෝ ජනාධිපතිවරයා විසින් පත් කරන ලද අමාත්‍යාංශ ලේකම්වරු හා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම්වල ආයතන සේවකයින්ද හැර පළාත් සභාවල සේවය කරන දීප ව්‍යාප්ත සේවා වලට ගැනෙන නිලධාරීන් ඇතුළු අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන්,

(අ) පත් කිරීම
(ආ) උසස් කිරීම
(ඇ) ස්ථාන මාරු කිරීම
(ඇ) විනය පාලනය හා සේවයෙන් පහ කිරීම.

### 2.2 කාර්යසාධනය

----------------

2017 වර්ෂයේ කාර්යසාධනය පිළිබඳව කැඳවන ලද තොරතුරු අනුව කොමිෂන් සභාවේ සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධනය පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.

| විස්තරය | 2017 ජනවාරි 01 දිනට ශේෂය | 2017 වර්ෂය තුළ ලද | 2017 වර්ෂය තුළ නිම කළ | 2017 දෙසැම්බර් 31 දිනට ඉතිරිය |
|---|---|---|---|---|
| පත් කිරීම් | 365 | 5771 | 5806 | 330 |
| උසස් කිරීම් | 141 | 3382 | 3162 | 361 |
| සේවා ව්‍යවස්ථා | 05 | 01 | 03 | 03 |
| ස්ථාන මාරු පරිපාටි | 04 | 18 | 13 | 08 |
| බඳවා ගැනීම් පරිපාටි | 56 | 76 | 61 | 71 |

2017 දෙසැම්බර් 31 දිනට බඳවා ගැනීම් පරිපාටි 71 ක් අනුමත කර නොතිබුණු අතර, බඳවා ගැනීම් පරිපාටි 18 ක් 2018 ජුනි 14 දින වන විට අනුමත කර තිබුණි. ඉතිරි බඳවා ගැනීම් පරිපාටි අනුමත නොකිරීමට අවශ්‍ය තොරතුරු අදාල ආයතනවලින් නිසි කලට වේලාවට ලබා නොදීමද බලපා තිබුණි. අභ්‍යන්තර වැඩපිළිවෙළක් සකස් කර ගන්නා ලෙස දන්වා එක් ස්ථාන මාරු පරිපාටියක් අදාල ආයතනය වෙත ආපසු යවා තිබුණි.

#### 2.2.1 සැලැසුම් කිරීම

----------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා කොමිෂන් සභාව විසින් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**2.3. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම**

**-------------------------------------------**

**නව ගොඩනැගිලි ඉදිකිරීම**

**----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කොමිෂන් සභාව සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා කොන්ත්‍රාත්කරු සමඟ රු.මිලියන 417 ක ගිවිසුමකට එළඹ තිබුණි. කොමිෂන් සභාව සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අදාළව එම ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු නියමිත කාල වකවානුව තුළ සාර්ථකව ඉටුකර ගැනීම කෙරෙහි කොමිෂන් සභාව සැහීමට පත්විය යුතු බවට 2014 දෙසැම්බර් 24 දිනැති අංක අමප/14/1823/501/040 දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිරීක්ෂණය වී තිබුණි.

(ii) මෙම ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2015 ජනවාරි 02 දින වැඩ ආරම්භ කර තිබූ අතර ගිවිසුම ප්‍රකාරව වැඩ ආරම්භ කර දින 900 ක් අවසන් වන විට එනම් 2017 ජුනි 22 දින වැඩ නිමකර භාරදීමේ සහතිකය නිකුත් කල යුතු විය. එහෙත් විගණන දිනය වන 2018 මාර්තු 08 දින වන විටද එහි වැඩ කටයුතු අවසන් කර භාරදීමට කටයුතු කර නොතිබුණි.

(iii) ගොඩනැගිල්ල ඉදි කිරීමට අදාල අමාත්‍ය මණ්ඩල තීරණයෙහි ශක්‍යතා අධ්‍යනයක් සිදු කළ යුතු බව දක්වා ඇතත් ව්‍යාපෘති පරිපාලනය පවරා ඇති ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ශක්‍යතා අධ්‍යනයක් සිදු කළ බව තහවුරු නොවුණු අතර කොමිෂන් සභාව විසින් ඒ පිළිබඳ සැලකිලිමත් විමකින් තොරව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ව්‍යාපෘති කළමනාකරණ ගාස්තුව ලෙස රු.12,056,100 ක මුදලක් ගෙවා තිබුණි.

(iv) කොන්ත්‍රාත් සැළසුම් කිරීමේදී නිශ්චිත කාලරාමුවකට අනුව සැලැසුම් සකස් කර එය නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතු වුවත්, නව ගොඩනැගිල්ලේ ඉදි කිරීම් කටයුතු සැලැසුම් කළ පරිදි 2017 ජුනි 22 දින නිම කරවා ගැනීමට නොහැකි වීම නිසා කොමිෂන් සභාවට මාස 7ක කාල පරිච්ඡේදය සඳහා ගොඩනැගිලි කුලී ලෙස රු. 16,422,000ක් පෞද්ගලික ආයතනයකට ගෙවීමට සිදු වී තිබුණි.

**2.4 වත්කම් කළමනාකරණය**

**----------------------------**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

**----------------------------**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා චක්‍රලේඛයේ 3.1.6 ඡේදය ප්‍රකාරව 2018 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, කොමිෂන් සභාව විසින් එම වාර්තා 2018 ජුනි 30 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**2.5 බැදීම් හා බැරකම්**

**-------------------**

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(ඇ) ඡේදයට අනුකූල නොවී 2018 වර්ෂයේ අදාල වැය විෂයයට ප්‍රතිපාදන සලසා නොතිබියදී රු.මිලියන 84.34 ක බැරකමකට එළැඹී තිබුණි.

## 2.6 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ කොමිෂන් සභාවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන | උපයෝජනය රු.මිලියන | ඉතිරිය රු.මිලියන | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| 2013 | පුනරාවර්තන | 114.61 | 114.57 | 0.04 | 0.03 |
| | මූලධන | 9.07 | 8.23 | 0.84 | 9.26 |
| | **එකතුව** | **123.68** | **122.80** | **0.88** | **0.71** |
| 2014 | පුනරාවර්තන | 125.44 | 123.26 | 2.18 | 1.74 |
| | මූලධන | 119.28 | 106.91 | 12.37 | 10.37 |
| | **එකතුව** | **244.72** | **230.17** | **14.55** | **5.94** |
| 2015 | පුනරාවර්තන | 141.54 | 140.14 | 1.40 | 0.99 |
| | මූලධන | 281.10 | 70.47 | 210.63 | 74.93 |
| | **එකතුව** | **422.64** | **210.61** | **212.03** | **50.17** |
| 2016 | පුනරාවර්තන | 159.00 | 157.01 | 1.99 | 1.25 |
| | මූලධන | 185.15 | 126.47 | 58.68 | 31.69 |
| | **එකතුව** | **344.15** | **283.48** | **60.67** | **17.63** |
| 2017 | පුනරාවර්තන | 197.11 | 184.17 | 12.94 | 6.56 |
| | මූලධන | 254.50 | 160.77 | 93.73 | 36.83 |
| | **එකතුව** | **451.61** | **344.94** | **106.67** | **23.62** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම

කොමිෂන් සභාවට අදාළ කාර්යභාරයන් ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු අයවැය ඇස්තමේන්තුව තාත්ත්වික ලෙස පිළියෙල කර ඇති බවත් නිරීක්ෂණය නොවීය. ඒ අනුව, කොමිෂන් සභාව විසින් නව ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුව අනුව අවශ්‍ය මුළු ප්‍රතිපාදනය සලසා ගෙන තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ගොඩනැගිල්ල ඉදිකිරීම අවසන් කර ගැනීමට නොහැකි වීම නිසා සලසා තිබුණු මුළු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 92.79 ක් හෙවත් සියයට 37ක් ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

**(ආ) විසර්ජන ගිණුම**

**-----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

**----------------------------------------------------**

මූලධන වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු.1,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම වෙනත් මූලධන වැය විෂයයකට මාරු කර තිබුණි.

**(ii) අධි ප්‍රතිපාදන සලසා තිබීම**

**----------------------------**

මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වුවත් කොමිෂන් සභාව විසින් පුනරාවර්තන වැය විෂයයක් හා මූලධන වැය විෂයයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 34 සිට සියයට 63 දක්වා අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**2.7 අග්‍රිම ගිණුම**

**-------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

කොමිෂන් සභාවේ සමාලෝචිත වර්ෂයේ අවසාන කාර්තුවේ ඉල්ලුම් කිරීමට සැලසුම් කළ අග්‍රිමය රු.මිලියන 111.22ක් ද ඉල්ලුම් කළ අග්‍රිමය රු.මිලියන 269.76ක් ද ලද අග්‍රිමය රු.මිලියන 142.76 ක් ද විය. මේ අනුව කොමිෂන් සභාවේ අග්‍රිම සැලැසුම් කළ පරිදි ඉල්ලුම් කිරීමකින් තොරව අවසාන කාර්තුවේ වැඩිපුර ඉල්ලුම් කිරීම නිසා අග්‍රිම නොලැබීමෙන් වර්ෂය අවසානයේ ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

**2.8 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

**-------------------------------------------**

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටයෙහි පරිදි ස්ථාවර වත්කම් ලේඛනය අදාළ වන පරිදි විගණකාධිපතිගේ එකඟත්වය ඇතිව පවත්වා ගත යුතු වුවත් කොමිෂන් සභාව විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලිනව පවත්වා ගෙන නොතිබුණි.

**2.9 අනුකූල නොවීම**

**----------------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**---------------------------------------------**

2000 මාර්තු 30 දිනැති අංක 10/2000 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල වල උපදේශක සභා අප්‍රමාදව පිහිටු විය යුතු වුවත් කොමිෂන් සභාව විසින් 2018 මාර්තු 30 දින වන විටත් අදාල උපදේශක සභා පිහිටුවා නොතිබුණි.

**2.10** **මානව සම්පත් කළමනාකරණය**

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් කොමිෂන් සභාව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 120.43 ක් වැය කර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 49 | 37 | 12 | - |
| (ii) | තෘතියික මට්ටම | 09 | 05 | 04 | - |
| (iii) | ද්විතියික මට්ටම | 115 | 99 | 16 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 54 | 45 | 09 | - |
| (v) | අනියම්/කොන්ත්‍රාත් | - | 03 | - | 03 |
| | එකතුව | 227 | 189 | 41 | 03 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

කොමිෂන් සභාවේ කටයුතු බාධාවකින් තොරව කරගෙනයාම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය හඳුනාගෙන සමාලෝචිත වර්ෂයේ පුරප්පාඩු පිරවීමට කොමිෂන් සභාව විසින් කටයුතු කළ යුතු වුවත් නිලධාරීන් තිදෙනෙකු පමණක් කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි. ඉතිරි පුරප්පාඩු 38 සමාලෝචිත වර්ෂයේදී පිරවීමට ආයතනයට නොහැකි වී තිබුණු අතර එකිනෙක මට්ටම්වල පැවති පුරප්පාඩු ප්‍රතිශතය සියයට 17 සිට සියයට 44 දක්වා පරාසයක පැවතුණි. 2018 වර්ෂයේදී ජ්‍යෙෂ්ඨ මට්ටම යටතේ පැවති පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇති අතර අනෙකුත් තනතුරු සඳහාද බඳවා ගැනීමට කටයුතු කරමින් පවතී.